කළුතර කලාප අධ්‍යාපන කාර්යාලය
දෙවන වාර පරීක්ෂණය - 2018

# චිත්‍ර කලාව I

**10 ශ්‍රේණිය** කාලය පැය 01

❖ <u>සැලකිය යුතුයි</u>

- **සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

---

- **පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක 01 - 05 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**



(01). ………………………….. විහාරය නමින් හැඳින්වෙන මෙම විහාරය හතරවන බුවනෙකබාහු රාජ සමයේ ඉදිකර ඇති අතර මෙය (02.) ………………………….. යුගයට ද අයත් යැයි සැලකේ. මෙම විහාරය දකුණු ඉන්දීය ශිල්පියෙකු වන (03.) ………………………….. නැමැති ශිල්පියා විසින් (04.) ………………………….. සම්ප්‍රදායට අනුව ගොඩ නඟන ලදී. (05.) ………………………….. නම් වූ වෘත්තාකාර ශිඛරයක් සහිත පියස්සකින් සමන්විත මෙම විහාරයේ දොරටුව ඉදිරිපස දෙකෙලවර ත්‍රිත්ව හෙවත් තුන් ඇඳුතු කුලුණු ඇත.

- **අංක 06 - 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.**

(06.) නගින්නන්ගේ පහසුව තකා අත්වැලක් ලෙස පියගැටපෙළ දෙපස නිර්මාණය වී ඇති කලා කෘතිය කුමක් ද? ……………………………………………………………..

(07.) වෙස් මුහුණු කර්මාන්තයේ දී ලී කඳන් පොතු ගසා පහසු කැබැලිවලට කපා ගැනීම කවර නමකින් හඳුන්වයි ද? ……………………………………………………………..

(08.)වාහල්කඩ දෙපස ඇති කණු දෙක කුමන නමකින් හඳුන්වයි ද? ……………………………………………………………..

(09.)ඉස්ලාමීය දේවස්ථානවල අලංකරණය සඳහා යොදන අක්ෂර විශේෂය කවර නමකින් හඳුන්වයි ද? ……………………………………………………………..

(10.)සනිකවාදී ශෛලියට මාරයින් චිත්‍රණය කළ මාර පරාජය සිත්තම ඇඳි සිත්තරා කවුද?

……………………………..……………………………………………………………………

- **අංක 11 - 15 තෙක් දී ඇති රූපවලට වඩාත් සෘජු සබඳතාවක් දක්වෙන රූප සටහන ඉදිරියෙන් ඇති A, B, C, D, E යන රූප සටහන් අතුරින් තෝරා එහි අක්ෂරය තිත් ඉරි මත ලියන්න.**

| | | |
|---|---|---|
| (11)  | (.....................................) | A.  |
| (12)  | (.....................................) | B.  |
| (13)  | (.....................................) | C.  |
| (14)  | (.....................................) | D.  |
| (15)  | (.....................................) | E.  |

- **අංක 16 - 20 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(16.) පාර්ශවගත බව හා අඛණ්ඩ කථන ක්‍රමය සිතුවම්වල අන්තර්ගත වනුයේ,

1. පොළොන්නරු යුගයේ ය.
2. මහනුවර යුගයේ ය.
3. ගම්පල යුගයේ ය.
4. අනුරාධපුර යුගයේ ය.

(17.) සසර ගමන අර්ථවත්වන ලෙස දේශීය ශිල්පියා විසින් නිර්මාණ කළ පෞරාණික කැටයම වන්නේ,

1. කොරවක් ගලෙනි.
2. මකර තොරණෙනි.
3. සඳකඩ පහණෙනි.
4. මුරගලෙනි.

(18.) රෝමයේ වතිකානු නගරයේ සිස්ටයින් දෙව් මැදුරේ අල්තාරය පිටුපස බිත්තියේ මයිකල් ඇන්ජිලෝ විසින් අඳින ලද ස්වර්ගය, මනුලොව, පරලොව, සංකේතාත්මකව කොටස්වලට බෙදා ඇති සිතුවම,

1. ආදම් මැවීම නම් වේ.
2. ඇතැන්ස් හි ගුරුකුලය නම් වේ.
3. අන්තිම විනිශ්චය නම් වේ.
4. අවසාන රාත්‍රී භෝජන සංග්‍රහය නම් වේ.

(19.) බුදුන් වහන්සේගේ ලංකාගමනය දක්වෙන මහියංගනං, නාගදීපං, කල්‍යාණං, පදලාංඡනං, යන දවැන්ත සිතුවම් චිත්‍රණය කළ සිත්තරා වනුයේ,

1. ඇම්. සාර්ලිස් ය.
2. ඩේවිඩ් පේන්ටර් ය.
3. ඒ.සී.ජී.එස්.අමරසේකර ය.
4. සෝලියස් මෙන්ඩිස් ය.

(20.) ලඟ දක්වෙන වස්තූන් විශාලවත්, ඈත දක්වෙන වස්තූන් කුඩාවටත් නිරූපණය කරන ක්‍රමය නම් කරනුයේ,

1. ත්‍රිමාණ ලක්ෂණ යන නමිනි.
2. පර්යාවලෝකය යන නමිනි.
3. ආකාශ පර්යාවලෝකය යන නමිනි.
4. වර්තනාක්‍රමය යන නමිනි.

- **ප්‍රශ්න අංක 21 - 25 දක්වා දී ඇති ප්‍රශ්නවලට F, G, H, I, J යන රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.**



F



G



H



I



J

(21.) "F" අක්ෂරයෙන් දක්වෙන සිතුවම සඳහා කවර ආභාසයක් ලැබී තිබේ ද ? ……………….

(22.) "G" අක්ෂරයෙන් දක්වෙන නිර්මාණයේ නම ලියන්න. …………………………………..…..

(23.) "H" අක්ෂරයෙන් දක්වෙන සිතුවම තිබෙන ස්ථානය නම් කරන්න. ………………………..

(24.) "I" අක්ෂරයෙන් දක්වෙන මූර්තියෙන් පිළිබිඹු වන්නේ කවර නර්තන සම්ප්‍රදායක් ද ?

……………………………………………………………………………………

(25.) "J" අක්ෂරයෙන් දක්වෙන සිතුවම අන්තර්ගතවන ජාතක කථාව නම් කරන්න.

……………………………………………………………………………………..

- **අංක 26 - 30 තෙක් දී ඇති එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු වචනය යොදා සම්පූර්ණ කරන්න.**

(26.) අඳුර තුළින් ආලෝකය දැක්වීමේ ශිල්ප ක්‍රමය …………………………….. නමින් හැඳින්වේ.

(27.) පරාල 26 ක් එක ලී ඇණයකින් සවිකළ විශිෂ්ට වාස්තු විද්‍යාත්මක නිර්මාණය ……………………………. නමින් හඳුන්වනු ලැබේ.

(28.) රෝමන් හා ගොතික් යනු ……………………………………… බැතිමතුන්ගේ දේවස්ථාන විශේෂයකි.

(29.) කණු මත ඉදිකරන විහාර ……………………………………… විහාර යනුවෙන් හඳුන්වයි.

(30.) නෙළුම් දණ්ඩක හැඩය රිද්මයානුකූලව යොදාගෙන නිර්මාණය කර ඇති නිශ්ශංක ලතා මණ්ඩපය ……………………………… යුගයේ නිර්මාණයකි.

- **අංක 30 - 35 තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍යය බැගින් ලියන්න.**

(31.) අභය මුද්‍රාව - ………..…………………………………………………………...

(32.) නිර්ජීවී - ………..………………………………………………………..…….

(33.) ප්‍රෙස්කෝ සීකෝ- ………..………………………………………………………...…

(34.) ශෛලමය - ………..…………………………………………………………..

(35.) සීගිරි චිත්‍ර - ………..…………………………………………………………

- **පහත දැක්වෙන කලා කෘතිය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක 36 සිට 40 තෙක් දී ඇති උප මාතෘකාවලට අදාළ ව අර්ථවත් වාක්‍ය පහක් ලියන්න.**



(36) හඳුනාගත් බව - ………..………………………………………………………

(37) ශිල්පියා - ………..……………………………………………………...

(38) තේමාව - ………..……………………………………………………...

(39) ස්ථානය - ………..……………………………………………………..

(40) සංරචනය - ………..……………………………………………………..

***

කළුතර කලාප අධ්‍යාපන කාර්යාලය
දෙවන වාර පරීක්ෂණය - 2018

# චිත්‍ර කලාව III

10 ශ්‍රේණිය කාලය පැය 02

❖ <u>සැලකිය යුතුයි</u>
- **'අ' කොටසින් හෝ 'ආ' කොටසින් හෝ 'ඉ' කොටසින් හෝ එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන එක චිත්‍රයක් පමණක් අඳින්න.**

## 'අ' කොටස - චිත්‍ර සංරචනය

1. ආගමික ස්ථානයක පුද පූජාවේ යෙදෙන බැතිමතුන් පිරිසක්
2. දොලක දිය නාන ළඳුන්
3. අලි ඇතුන් සහ සුන්දර වන දහන
4. ගමේ ඉරිදා පොළ

## 'ආ' කොටස - මෝස්තර

5. සත්ත්ව හැඩතල ඇසුරින් සරමක වාටියකට මෝස්තරයක්
6. පස්පෙති මලක් ඇසුරින් අලංකාර චීත්ත රෙද්දක් සඳහා ව්‍යාප්ත මෝස්තරයක්
7. වෘත්තාකාර පිත්තල බන්දේසියකට සිංහල සැරසිලි මෝස්තර උපයෝගී කර ගනිමින් මෝස්තර නිර්මාණය කරන්න.

## 'ඉ' කොටස - ග්‍රැෆික් චිත්‍ර

8. "වෙස් මුහුණු" නමින් රචිත පොතක් සඳහා පිට කවරයකට සුදුසු නිර්මාණය සැලසුම් කර වර්ණ කරන්න.
9. "ජල සම්පත සුරකිමු" යන තේමාව ඉස්මතු වන පරිදි විචිත්‍රවත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.
10. පැණි බීම බෝතලයකට සුදුසු අලංකාර ලේබලයක් නිර්මාණය කරන්න.

***